## මාතලේ දිස්ත්‍රික්කයේ ආර්ථික පසුබිම

2022 වර්ෂයේ දිස්ත්‍රික්කයේ මුළු රැකියා නියුක්තියෙන් 24.6% ක් කෘෂිකාර්මික අංශයේ ද, 21.6%  කර්මාන්ත අංශයේ ද,  53.8% සේවා අංශයේ ද නියුක්ත ව සිටින බව පෙනේ. වෙනත් අංශයන්හි කටයුතු කරන විශාල පිරිසක් ද ද්විතියික කටයුත්තක් ලෙස කෘෂිකාර්මික අංශයේ යෙදි සිටින බැවින් දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් බහුතරය තම ජීවනෝපාය ලෙස කෘෂිකාර්මික කටයුතු වල යෙදී සිටින බව පැහැදිලි වේ. මාතලේ දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 50,480 ක ප්‍රමාණයක් කෘෂිකාර්මික භෝග වගාවන් සඳහා යොදා ගෙන ඇති අතර එය දිස්ත්‍රික්කයේ සමස්ත ඉඩම් පරිභෝජනයෙන් 24.5% කි.

දිස්ත්‍රික්කයේ වියළි කලාපීය ප්‍රදේශයට අයත් ගලේවෙල ,දඹුල්ල ,නාඋල ,ලග්ගල ,පල්ලේපොල හා විල්ගමුව යන ප්‍රා.ලේ.කොට්ඨාසවල ප්‍රධාන වශයෙන් වී වගාව ද ඊට අමතරව ධාන්‍ය භෝග හා පහතරට එළවළු වගාව ද බහුලව සිදු කෙරේ. විශේෂයෙන්ම යල කන්නයේදී ගලේවෙල ,දඹුල්ල ,නාඋල හා ලග්ගල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ලොකු ළූණු වගාව ඉතා සාර්ථකව සිදුවන අතර එය සමස්ත නිෂ්පාදනයෙන් 50 % ක් පමණ දායකත්වයක් සපයනු ලැබේ. 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලොකු ළූණු නිෂ්පාදනය පිළිවෙලින් මෙ.ටො. 9023, 15217, 39096 සහ 4994.7 ලෙස සමස්ත නිෂ්පාදනයට දායක වී ඇත.

ස්ථිර හා අර්ධ ස්ථිර භෝග වගාවන් ද දිස්ත්‍රික්කයේ පුරා ව්‍යාප්තව ඇත. මේ යටතේ තේ හා පොල් වගාව ද ඊට අමතරව ගම්මිරිස්,කරාබු, කෝපි, කුරුඳු, කරඳමුංගු, සාදික්කා හා පුවක් ආදි සුළු අපනයන භෝග බහුලව වගා කෙරේ. එසේම අඹ, කෙසෙල්,පැපොල් හා කිලෝපේර ආදි පළතුරු භෝග වගාවන්ද දක්නට ලැබේ.

විශේෂයෙන් මාතලේ දිස්ත්‍රික්කය කෘෂිකර්මාන්තයට මෙන්ම සංචාරක කර්මාන්තයට ද විශේෂ තැනක් හිමිකරගෙන ඇත. සංස්කෘතික වටිනාකමක් ඇති රංගිරි දඹුලු විහාරය, අළුවිහාරය, සීගිරිය සහ පිදුරංගල යන ස්ථානයන්ද රිවස්ටන් ,කන්ඩලම සහ සෙම්බුවත්ත ආදි ස්ථානයන්ද, වස්ගමුව ජාතික වනෝද්‍යානයද සංචාරක ආකර්ෂණය දිනාගෙන ඇත. තවද කුඩා කර්මාන්ත වල නියැලෙන්නවුන් අතුරින් මාතලේ දිස්ත්‍රික්කය තුළ සිදු කරනු ලබන ලාක්ෂා කර්මාන්තයටද විශේෂ ස්ථානයක් හිමිව ඇත.



## Economic Background of Matale District

In the year 2022, 24.6% of the total employment in the district is in the agricultural sector, 21.6% in the industrial sector and 53.8% in the service sector. As a large number of people working in other sectors are also engaged in agriculture as a secondary activity, it is clear that the majority of the population of the district is engaged in agriculture as their livelihood. The total area of Matale district, 50,480 hectares are used for agricultural crops, which is 24.5% of the total land consumption of the district.

In the districts of Galewela, Dambulla, Naula, Laggala, Pallepola and Wilgamuwa, which belong to the dry zone of the district, paddy cultivation is mainly done, and in addition, grain crops and lowland vegetable cultivation are widely practiced. Especially during the yala season, big onion cultivation is very successful in Galewela, Dambulla, Naula and Laggala divisional secretaries and it contributes about 50% of the total production. From the year 2019 to the year 2022, the production of big onion will be MT. 9023,15217, 39096 and 4994.7 have contributed to the overall production.

Permanent and semi-permanent crop plantations are also spread over the district. Under this, tea and coconut cultivation are also widely cultivated, besides pepper, cloves, coffee, cinnamon, cardamom, nutmeg and areca nut etc. are cultivated as minor export crops. Also, fruit crops such as mango, banana, papaya and Guavas are also be cultivated.

Matale district in particular has a special place for agriculture as well as tourism industry. The culturally valuable places like Rangiri Dambulu Vihara, Aluvihara, Sigiriya and Pidurangala, Rivaston, Kandalam and Sembuwatta , Wasgamuwa National Park and ect. have also attracted tourists. And the laksa industry one of the special industries among the industries , which is carried out in Matale district.

